# <u>රක්ෂණය</u>

"වරින් වර හෝ එකවර කරන ගෙවීමක් සලකා යම් පාර්ශ්වයකට සිදු විය හැකි හානියක් හෝ අලාභයක් හෝ වෙනුවෙන් වන්දි ගෙවීමට රක්ෂකයෙකු සමග ඇති කරගන්නා එකඟතාවය" රක්ෂණය ලෙස හැඳින්විය හැකිය.

රක්ෂණය පදනම් වී ඇති මුලධර්මය "අවදානම් ඒකරාශිකරණය" යි. එනම් රක්ෂණ අරමුදල ගොඩනැගී ඇත්තේ අවදානම් දැරීමට අනාගතයේ සිදුවේ යැයි අපේක්ෂා කරන සියළුම රක්ෂිතයන්ගේ වාරික මුදල්වල එකතුවෙනි. එහෙත් එම සියළුම රක්‍ෂිතයන් හට අවදානම් සිදු නොවන අතර නිශ්චිතවම අවදානම් වලට ලක්වන අය සඳහා පමණක් වන්දි ගෙවනු ලැබේ. එනම් රක්ෂණයේ පැවැත්ම රඳී ඇත්තේ 'අවදානම් ඒකරාශිකරණය' මත ය.

<u>අවදානම</u>

මුල්‍යමය වශයෙන් ඇස්තමේන්තු කල හැකි කිසයම් හානියක් සිදු වීමට ඇති ඉඩකඩ / සම්භාවිතාවයි.

අවදානමක් තුළ අන්තර්ගත ලක්ෂණ

1. අවිනිශ්චිතතාව
   අවදානමේ පදනම අවිනිශ්චිතතාව හෙවත් නොදැනුවත්කමයි.
2. විශාලත්වය / ප්‍රමාණය
   කිසියම් සිද්ධියකදී වූ ප්‍රතිඵලයේ ප්‍රමාණය
3. උපද්‍රවය
   හානිය හෙවත් අලාභය ඇති වීමට හේතුව

අවදානම, මුල්‍ය අවදානම් හා මුල්‍ය නොවන අවදානම් ලෙසද, රක්ෂණය කල හැකි අවදානම් සහ රක්ෂණය කල නොහැකි අවදානම් ලෙසද වර්ග කරයි.

හානිය කොපමණදැයි මුදලින් මැනිය හැකි අවදානම් මුල්‍ය අවදානම් වන අතර මුල්‍යමය වශයෙන් මැනිය නොහැකි අවදානම් මුල්‍යමය නොවන අවදානම් වේ.

<u>රක්ෂණය කල හැකි අවදානම් වල තිබිය යුතු ලක්ෂණ</u>

1. පුරෝකථනය කල හැකි බව
   අනාගතයේදී සිදු විය හැකි අවදානම සංඛ්‍යාත්මක වශයෙන් ගණනය කල හැකි වීම

2. අහඹු ලෙස සිදු වීම
   පාඩුව සිදු විය යුත්තේ අහඹුවකින් මිස නියතයකින් නොවන බව

3. සම්බන්ධතා වලින් තොර වීම
   සිදු වී ඇති පාඩුව වෙනත් රක්ෂිත අලාභ වලින් වෙන්කර හඳුනා ගත හැකි වීම

4. සත්‍යාපනය කල හැකි වීම
   අලාභ සිදු වීමේ හේතුව, ස්ථානය, වෙලාව හා ප්‍රමාණය විශ්ලේෂණය කළ හැකි වීම

රක්ෂණය කල හැකි අවදානමක් වීම සඳහා ඉහත ලක්ෂණ අනිවාර්යෙන් තිබිය යුතු අතර ඉහත ලක්ෂණ ඉටු නොවන්නේ නම් එවැනි අවදානම් රක්ෂණය කල නොහැකි අවදානම් වේ.

| රක්ෂණය කල හැකි අවදානම් | රක්ෂණය කල නොහැකි අවදානම් |
|---|---|
| 1. තම ජීවිතය පිළිබඳ අවදානම<br>2. හදිසි අනතුරු වලින් වන හානි<br>3. ගොඩනැගිලි හා වෙනත් වතක්ම් වලට ගින්නෙන් සිදු වන හානි<br>4. වාහන අනතුරු වලින් සිදු වන හානි<br>5. මාර්ගස්ථ මුදල් හා සේප්පුවේ ඇති මුදල් වලට වන හානි<br>6. ණයගැතියෙකුගෙන් ණය නොලැබී යාමේ අවදානම<br>7. මාර්ගස්ථ භාණ්ඩ වලට ඇති වන අලාභ<br>8. සතුන්, භෝග වගාවන් හා අස්වැන්න ඇසුරින් සිදු වන හානි හා අලාභ | 1. අනාගතයේ ඇති විය හැකි අලාභ<br>2. කළමනාකරුවන් හෝ ව්‍යවසායකයින්ගේ තීරණ නිසා ඇතිවන අලාභ<br>3. ස්වභාවික හේතූන් මත ඇතිවන ව්‍යාපාරික අවදානම (යල් පැනීම, ක්‍ෂය වීම, වාෂ්ප වීම)<br>4. අනාගත වෙළඳපල තේරුම් ගැනීමට නොහැකි වීම නිසා සිදුවන අලාභ<br>5. මෝස්තරය වෙනස්වීම, වෙළඳ උත්පාත, අවපාත වීම නිසා සිදුවන හානි<br>6. තම හැකියාව හා දක්ෂතාව මත තීරණය වන පුද්ගලික හානි |

"රක්ෂණය යනු වැලැක්වීමක් නොව පිළියමකි"

වැලැක්වීමක් යනුවෙන් අදහස් කරන්නේ නිශ්චිත ලෙසම අවසන් කිරීමකි. පිළියමක් යනු තාවකාලික වශයෙන් කෙරෙන සහනයකි. රක්ෂණය මඟින් කෙරෙනුයේ අවදානම් වලට මුහුණ දීමෙන් සිදු වන හානි සඳහා වන්දි ලබා දෙමින් සහන සැලසීම හෙවත් අවදානම තුනී කිරීම මිස අදාළ විෂය වස්තුවට සිදු වන හානි වැලැක්වීමක් නොවේ.

<u>ව්‍යාපාරවල පැවැත්ම සඳහා රක්ෂණය දායක වන ආකාරය</u>

1. රක්ෂණය මඟින් ව්‍යාපාර අවාධානම් ආවරණය කරන නිසා ව්‍යාපාර ආරම්භ කිරීමට ආයෝජකයින් යොමු වීම.
2. රක්ෂණ සමාගම් විවිධ ආයෝජන කටයුතු වල යෙදීම
3. මුහුදු උවදුරු රක්ෂණය නිසා ජාත්‍යන්තර වෙළඳාම දියුණු වීම
4. විවිධ රක්ෂණ ක්‍රම හඳුන්වා දීම තුළින් ව්‍යාපාර කටයුතු පුළුල් වීම
5. මූල්‍ය වෙළඳපල දියුණු වීම
6. අවදානම වැඩි පිරිසක් වෙත බෙදී යාම නිසා අවදානම තුනී කරගත හැකි වීම

<u>රක්ෂණ ගිවිසුම</u>

රක්ෂණ ආවරණයක් ඉල්ලා සිටින්නා ඉදිරිපත් කරන රක්ෂණ යෝජනා පත්‍රයක් රක්ෂණ ආයතනයක් විසින් පිළිගැනීමෙන් පසුව දෙපාර්ශවය අතර ඇති කර ගන්නා ලිඛිත එකඟතාවය

- රක්ෂණ ගිවිසුමක් ඇති කරගැනීම සඳහා තිබිය යුතු අවශ්‍යතා / මූලිකාංග
  - i. නෛතික බැඳීමක් ඇති කර ගැනීමේ අවශ්‍යතාව
  - ii. අර්පණය / යෝජනාව
  - iii. ප්‍රතිග්‍රහණය / පිළිගැනීම
  - iv. නීතියට එකඟ බව / නෛතික බව
  - v. ඒ ඒ පාර්ශ්වයන්ට නෛතික බැඳීමක් ඇති කර ගැනීමට ඇති හැකියාව

<u>රක්ෂණ ඔප්පුව</u>

රක්ෂණ ගිවිසුමක් ඇති වූ බවට රක්ෂණ සමාගම විසින් රක්ෂිතයාට දෙනු ලබන ලිඛිත සහතිකයයි.

- රක්ෂණ ගිවිසුමකට සම්බන්ධ ප්‍රධාන පාර්ශ්ව තුනකි. එනම් පළමු පාර්ශ්වය (රක්ෂිතයා), දෙවන පාර්ශ්වය (රක්ෂකයා) සහ තෙවන පාර්ශවයයි.

## රක්ෂණ මූලධර්ම

**රක්ෂණ ක්‍රමය විධිමත්ව පවත්වාගෙන යාම සඳහා රක්ෂණ මූලධර්ම අනුගමනය කල යුතුය. රක්ෂණ මූලධර්ම 04 ක් සහ උපමූලධර්ම 02 ක් ක්‍රියාත්මක වේ.**

1. රක්ෂ්‍ය හිමිකම
2. උපරිම විශ්වාසය
3. හානිපූර්ණය
    a. දායකත්වය
    b. ආදේශනය
4. ආසන්නතම හේතුව

## රක්ෂ්‍ය හිමිකම

රක්ෂණය කරන විෂය වස්තුව පිළබඳ රක්ෂණ ඔප්පුව ලබා ගන්නා තැනැත්තාට හිමිකමක් තිබිය යුතු බව මින් අදහස් කරයි. උදාහරණ ලෙස,

a. සැමියාට බිරිඳ පිළිබඳවත්, බිරිඳට සැමියා පිළිබඳවත් රක්ෂණීය හිමිකමක් ඇත.
b. ගොඩනැගිල්ලක් පිළිබඳ රක්ෂණීය අයිතිය එහි අයිතිකරුට මෙන්ම බදුකරුට ද ඇත.
c. ණයහිමියෙකුට තම ණයගැතියෙකු ගේ ජීවිතය, අදාළ ණය ප්‍රමාණයට රක්ෂණය කිරීමට හිමිකමක් ඇත.
d. නැව්ගත භාණ්ඩ තොගයක් පිළිබඳව ආනයනකරුට, අපනයනකරුට මෙන්ම නැව් සමාගමට ද රක්ෂණීය හිමිකමක් ඇත.
e. චිත්‍රපට අධ්‍යක්ෂවරයෙකුට සිය චිත්‍රපටයේ නළුවකුගේ ජීවිතය සම්බන්ධ රක්ෂණ හිමිකමක් ඇත.

රක්ෂණ හිමිකම ඔප්පු කල යුතු අවස්ථා

i. මුහුදු උවදුරු රක්ෂණය - හිමිකම් පාන අවස්ථාවේදී
ii. ජීවිත රක්ෂණය - ඔප්පුව ලබා ගැනීමේදී
iii. අනෙකුත් රක්ෂණ - මුලාරම්භයේ මෙන්ම හිමිකම් පාන අවස්ථාවේදී

## උපරිම විශ්වාසය

රක්ෂණය කරනු ලබන විෂය වස්තුව සම්බන්ධයෙන් වැදගත් වේ යැයි සලකනු ලබන සියළුම කරුණු පිලිබඳ සම්පූර්ණ සහ සත්‍ය තොරතුරු සැපයීමට රක්ෂකයා සහ රක්ෂිතයා යන දෙපාර්ශ්වයම කටයුතු කරනවා යැයි යන විශ්වාසය මින් අදහස් කරයි.

| රක්ෂිතයා හෙළිදරව් කල යුතු වැදගත් කරුණු | | රක්ෂකයා හෙළිදරව් කල යුතු වැදගත් කරුණු |
|---|---|---|
| ජීවිත රක්ෂණය සම්බන්ධව | හානි රක්ෂණය සම්බන්ධව | |
| ▪ පුද්ගලයා පිලිබඳ සියලු විස්තර<br>▪ සෞඛ්‍ය තත්වය<br>▪ අදායම් තත්වය<br>▪ යැපෙන්නන් සංඛ්‍යාව<br>▪ වත්කම් තත්වය | ▪ වත්කම් වල ගත් මිල සහ වෙළඳ අගය<br>▪ රක්ෂණ හිමිකම තහවුරු කිරීමට අවශ්‍ය තොරතුරු<br>▪ සම්බන්ධ වී ඇති ගිවිසුම් පිලිබඳ විස්තර | ▪ ඔප්පුවේ ස්වභාවය<br>▪ වාරික ප්‍රමාණය<br>▪ ප්‍රතිලාභ<br>▪ වන්දි ගෙවීම<br>▪ ඔප්පුව කල් පිරිම<br>▪ ඔප්පුව පැවරීම<br>▪ අප්‍රාණික වීම |

## හානිපූර්ණය

**යම් රක්ෂිත දේපලකට හානියක් සිදු වූ විට එම දේපල යථා තත්වයට පත්කර ගැනීමට ප්‍රමාණවත් වන්දියක් පමණක් ගෙවීම**

**මෙම මුලධර්මය ඔස්සේ රක්ෂණයෙන් ලාභ ලැබීම වළක්වන අතර මෙය ජීවිත රක්ෂණයට බල නොපායි.**

**මේ යටතේ,**

I. ඌන රක්ෂණයකදී වන්දිය ගණනය කිරීම

$$\text{වන්දියේ ප්‍රමාණය} = \frac{\text{රක්ෂිත වටිනාකම}}{\text{සත්‍ය වටිනාකම}} x \text{ සිදු වූ හානිය}$$

II. අධි රක්ෂණයකදී වන්දි ලැබෙන ආකාරය
**පූර්ණ අලාභයකදී වෙළඳපල අගයද අර්ධ අලාභයකදී සිදුවූ අලාභයේ ප්‍රමාණයද ගෙවනු ලැබේ. වෙළඳපල අගය රක්ෂිත වටිනාකමට වඩා වැඩි නම් රක්ෂිත වටිනාකම ගෙවයි.**

## දායකත්වය

**යම් දේපලක් රක්ෂණ ආයතන කිහිපයක රක්ෂණය කර ඇති විටෙක, අදාළ වත්කමට හානියක් සිදු වුවහොත් ඒ සඳහා අදාළ සියළුම රක්ෂණ ආයතන අනුපාතිකව දායක විය යුතු බව**

**මෙම මුලධර්මය ඔස්සේද රක්ෂණයෙන් ලාභ ලැබීම වළක්වන අතර මෙය ජීවිත රක්ෂණයට බල නොපායි.**

## ආදේශනය

**රක්ෂිත දේපලකට සිදු වූ හානියකදී රක්ෂණ සමාගම වන්දි ගෙවීමෙන් පසු ව බාහිර පාර්ශ්වයන්ගෙන් රක්ෂිතයාට ලබා ගත හැකි වෙනත් වාසි හා අයිතීන් රක්ෂකයාට පවරා දීම**

**මෙම අයිතිය රක්ෂිතයා විසින් ''ආදේශන ලිපිය'' ක් මාර්ගයෙන් ලබා දෙයි.**

**මෙම මුලධර්මය ඔස්සේද රක්ෂණයෙන් ලාභ ලැබීම වළක්වන අතර මෙය ජීවිත රක්ෂණයට සහ හදිසි අනතුරු රක්ෂණයට බල නොපායි.**

**ආදේශන අයිතිය ලබා ගැනීමේදී රක්ෂකයා අවධානය යොමු කල යුතු කරුණු**

- **වන්දි ගෙවීමෙන් අනතුරුව අදාළ ආවරණ ලබා ගැනීමට කටයුතු කල යුතුය.**
- **එසේ ලබා ගන්නා අතුරු ආවරණ, ගෙවූ වන්දි මුදල නොඉක්මවිය යුතුය.**
- **'දයාන්විත වන්දියක්' ගෙවූ අවස්ථාවක ආදේශන අයිතිය රක්ෂකයාට හිමි නොවේ.**
- **ආදේශන වත්කමේ සුන්බුන් අගය වන්දි ගෙවූ සමාගමට හිමි වේ.**

## ආසන්නතම හේතුව

**රක්ෂිත දේපලකට හෝ ජීවිතයකට සිදු හානියකට හේතු කිහිපයක් බලපා ඇති විටෙක වන්දි ගෙවීමට නම්, හානිය සිදු වීමට බලපෑ ආසන්නතම හේතුව රක්ෂණ ඔප්පුවෙන් ආවරණය විය යුතු බව**

ප්‍රතිරක්ෂණය

රක්ෂණ සමාගමක් විසින් භාර ගන්නා ලද රක්ෂණ අවදානමක් එම රක්ෂණ සමාගම විසින් තවත් රක්ෂණ සමාගමක් හෝ සමාගම් කිහිපයක රක්ෂණය කිරීම ප්‍රතිරක්ෂණය ලෙස හඳුන්වයි. ප්‍රතිරක්ෂණය මඟින් රක්ෂණ සමාගම් වල වගකීම විතැන් කල හැකිය.

ප්‍රතිරක්ෂණයේ ප්‍රයෝජන

- විශාල වටිනාකමක් ඇති වත්කම් රක්ෂණය කල හැකි නිසා වන්දි ලැබෙන බවට සහතික වීම
- ප්‍රතිරක්ෂණය හේතුවෙන් රක්ෂිතයාගේ වාරික මුදල අඩු වීම
- රක්ෂණ ව්‍යාපාරයේ දියුණුව සහ අඛණ්ඩ පැවැත්ම තහවුරු වීම
- අවදානම වැඩි පිරිසක් වෙත බෙදී යාම

ප්‍රාරක්ෂණය

විශාල වටිනාකමක් ඇති වත්කමක් සම්බන්ධයෙන් ඇති අවදානමක් කොටස් වශයෙන් වෙන් කර රක්ෂණ සමාගම් කිහිපයකට භාර දීම මෙහිදී සිදුවේ. තමා භාර ගත් අවදානමේ ප්‍රමාණයට ඒ ඒ රක්ෂණ සමාගම වන්දි ගෙවනු ලැබේ.

ද්විත්ව රක්ෂණය

රක්ෂිතයෙකු විසින් සිය අවදානම රක්ෂණ සමාගම් දෙකක හෝ කිහිපයක් යටතේ රක්ෂණය කිරීම ද්විත්ව රක්ෂණය ලෙස හඳුන්වයි. එනම් එකම අවදානමක් වෙනුවෙන් රක්ෂණ සමාගම් කිහිපයකින් වෙන් වෙන් වශයෙන් ඔප්පු ලබා ගැනීමයි.

ඌන රක්ෂණය සහ අධි රක්ෂණය

- ඌන රක්ෂණය මෙන්ම අධි රක්ෂණය ද අවාසිදායක ය.

ඌන රක්ෂණය යනු කිසියම් වත්කමක සත්‍ය වටිනාකමට වඩා අඩු අගයකට අදාළ වත්කම රක්ෂණය කිරීම යි.  මෙහිදී වන්දි ගෙවනු ලබන්නේ අනුපාතිකව වීම නිසා සිදුවූ අලාභයට වඩා අඩු වන්දියක් ලැබෙයි. එම නිසා ඌන රක්ෂණය අවාසිදායකය. ඌන රක්ෂණයක් සිදු කරන්නේ රක්ෂණය අනිවාර්ය වූ විටෙක සහ අඩු රක්ෂණ වාරිකයක් ගෙවීමට හැකි වීම මතයි.

අධි රක්ෂණය යනු වත්කමක සැබෑ අගයට වඩා වැඩි අගයකට රක්ෂණය කිරීමයි. මෙහිදී හානි සිදු වුවහොත් සම්පූර්ණ හානියකදී වෙළඳපල අගය හා සත්‍ය අගය යන දෙකෙන් අඩු අගය ලබා දෙන අතර අර්ධ අලාභයකදී ගෙවන්නේ එම අලාභ ප්‍රමාණය පමණකි. එසේම වැඩි වාරිකයක්ද ගෙවීමට සිදු වීම නිසා අධි රක්ෂණය ද අවාසිදායක ය. අධි රක්ෂණයක් සිදු කරන්නේ අදායම් බදු සහන ලබා ගැනීමට සහ ණය ඇප වශෙන් රක්ෂණ ඔප්පු ඉදිරිපත් කිරීමේදී වැඩි වටිනාකමක් ආරෝපණය කිරීමේ අරමුණින් ය.

රක්ෂණ වර්ගීකරණය

**රක්ෂණය ප්‍රධාන වශයෙන් වර්ග දෙකකට වෙන් කරයි.**

1. **ආරක්ෂණය / දිගු කාලින රක්ෂණය**
2. **රක්ෂණය**

**ආරක්ෂණය සහ රක්ෂණය අතර වෙනස්කම්**

| රක්ෂණය | ආරක්ෂණය |
|---|---|
| • රක්ෂණය යනු දේපල, වගකීම් පිළබඳ අයිතිය සම්බන්ධ රක්ෂණයයි.<br>• ගෙවූ වාරික ආපසු ලබා ගත නොහැකිය.<br>• ඉතිරි කිරීමට සමාන නොවේ.<br>• නිශ්චිතවම අවදානම භාර නොගනියි.<br>• දේපල හෝ වගකීම් වලට සම්බන්ධ වේ.<br>• හානිපූර්ණය අදාළ වේ.<br>• පැවරිය හැකිය.<br>• සාමන්‍යයෙන් වසරකට වරක් වාරික ගෙවිය යුතුය. | • ආරක්ෂණය යනු පුද්ගලයෙකුගේ ජීවිතය සම්බන්ධ රක්ෂණයයි.<br>• හානියක් සිදු වුවත් නැතත් ගෙවූ වාරික නැවත ලබා ගත හැකිය.<br>• ඉතිරි කිරීමකට සමාන වේ.<br>• නිශ්චිතවම අවදානම භාර ගනියි.<br>• පුද්ගලයෙකු හා සම්බන්ධ වේ.<br>• හානිපූර්ණය අදාළ නොවේ<br>• පැවරිය නොහැකිය.<br>• දිගුකාලයක් වාරික ගෙවිය යුතුය. |

ජීවිත රක්ෂණය

**රක්ෂිතයාගේ මරණය සහ වෙනත් ශාරීරික උපද්‍රව හේතුවෙන් අවධානම්වලට මුහුණ පෑ විට රක්ෂිතයාට හෝ ඔහුගේ යැපෙන්නන්ට මූල්‍යමය ප්‍රතිලාභ ලබා දීම ජීවිත රක්ෂණයෙන් සිදුවේ.**

**ජීවිත රක්ෂණයේ ප්‍රධාන අරමුණු දෙකකි.**

1. **රක්ෂිතයා ඔප්පුව කල්පිරෙන තෙක් ජීවත් වුවහොත් රක්ෂිතයාට මූල්‍ය පහසුකම් සහිත විශ්‍රාම කාලයක් ලබා දීම.**
2. **රක්ෂිතයාගේ මරණින් පසු යැපෙන්නන්ට ප්‍රතිලාභ ලබා දීම.**

ජීවිත රක්ෂණයක් ලබා ගත් අයෙකු හට ලබා ගත හැකි ප්‍රතිලාභ

1. **ඔප්පුව කල් පිරෙන තෙක් ජීවත් උවහොත් මුහුණත අගය හා අනෙකුත් ප්‍රතිලාභ ලබා ගත හැකි වීම.**
2. **අකල් මරණයකදී යැපෙන්නන්ට ප්‍රතිලාභ ලබා දීම.**
3. **ණය ලබා ගැනීමේදී ඇපයක් ලෙස භාවිතා කල හැකි වීම.**
4. **ලෙඩ රෝග ආදිය සඳහා වෛද්‍ය ගාස්තු, රෝහල් ගාස්තු ආදිය ලබා ගත හැකි වීම.**
5. **දූ දරුවන්ගේ විවාහ, අධ්‍යාපන කටයුතු වලදී මූල්‍ය සහන සැලසීම.**
6. **ඉතිරි කිරීමේ ක්‍රමයක් ලෙස භාවිතා කල හැකි වීම.**

ජීවිත රක්ෂණයක වාරික මුදල තීරණය කිරීමේදී සලකා බලන සාධක

- **රක්ෂණ ඔප්පුවේ වටිනාකම**
- **රක්ෂිතයාගේ වයස**
- **රක්ෂිතයාගේ සෞඛ්‍ය තත්වය**
- **කල් පිරීමට ගත වන කාලය**
- **ඔප්පුවේ ස්වභාවය**
- **රක්ෂිතයාගේ ආදායම**

ජීවිත රක්ෂණ ඔප්පු වර්ග

1. **කාලීන රක්ෂණ ඔප්පුව** ***(උදා : ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ කාලීන ජීවිත රක්ෂණ ඔප්පුව)***
   **ජීවිතයේ කිසියම් කාල සීමාවක් දක්වා පමණක් ලබා ගන්නා රක්ෂණ ඔප්පු විශේෂයකි. ඔප්පුව කල්පිරෙන තෙක් රක්ෂිතයා ජීවත් වුවහොත් රක්ෂිතයාටද, රක්ෂිතයා මිය ගියහොත් ඔහුගේ යැපෙන්නන්ටද රක්ෂිත මුදල ගෙවනු ලැබේ.**

2. **යාවජීව ජීවිත රක්ෂණ ඔප්පුව** ***(උදා : සෙලින්කෝ යාවජීව රක්ෂණ ඔප්පුව)***
   **රක්ෂිතයා ජීවත් වන කාලය තුලම වාරික ගෙවීම සිදු කරනු ලබන අතර රක්ෂිතයාගේ මරණින් පසු එකඟ වූ රක්ෂිත මුදල යැපෙන්නන්ට ගෙවනු ලැබේ.**

3. **පරිත්‍යාග ආරක්ෂණ ඔප්පුව** ***(උදා : දිවිතිලිණ, සිප්සෙත, යසඉසුර)***
   **මහලු කාලයේදී ආපසු ලබා ගැනීමට හැකි වන පරිදි මෙන්ම යම් ලෙසකින් රක්ෂිතයා අකල් මරණයකට ගොදුරු වුවහොත් ඔහුගේ යැපෙන්නන්ට ප්‍රතිලාභ සැපයීම ට ගිවිසගත් රක්ෂණ ඔප්පුවකි.**

4. **විවාහ දායාද හා අධ්‍යාපන ආධාර රක්ෂණ ඔප්පුව**
   **රක්ෂිතයාගේ දූ දරුවන් විවාහවන අවස්ථා වලදී දායාදයක් වශයෙන් හා දූ දරුවන්ගේ අධ්‍යාපන අවශ්‍යතා සඳහා ප්‍රතිලාභ සැලසීම මෙම රක්ෂණයේ අරමුණයි.**

5. **වාර්ෂික ආරක්ෂණ ඔප්පුව** ***(උදා : යෂ්ටිය )***
   **නිශ්චිත කාලපරිච්ඡේදයක් සඳහා ලබාගත් රක්ෂණයක් වන මෙය කල්පිරීමෙන් පසු රක්ෂිතයාගේ මරණය දක්වා විශ්‍රාම වැටුපක ස්වරූපයෙන් රක්ෂිත මුදල ආපසු ගෙවයි.**

ජීවිත රක්ෂණ ඔප්පුවක් සම්බන්ධ අනුග්‍රාහක කාලය

- ඔප්පුවේ සඳහන් දිනට වාර මුදල් ගෙවීමට අපොහොසත් වූවකු හට ඉන් පසුවත් මුදල් ගෙවීමට ලබා දෙන කාලය අනුග්‍රාහක කාලය ලෙස හඳුන්වයි.

ජීවිත රක්ෂණ ඔප්පුවක් අප්‍රාණික වීම

- වාර මුදල් ගෙවීමට ලබා දුන් අනුග්‍රාහක කාලයද ඉක්ම ගිය පසු වාර මුදල් හිඟව තැබුවහොත් රක්ෂණ ඔප්පුව අප්‍රාණික වුවා යැයි සැලකෙයි.

අප්‍රාණික වූ රක්ෂණ ඔප්පුවක් නැවත ප්‍රාණවත් කළහැකි ආකාරය

1. සාමාන්‍ය ප්‍රාණවත් කිරීම
   මාස හයක හිඟයක් දක්වා පමණක් වාරික ගෙවීමට ඇත්නම් එම මුදල් හා පොලිය එකවර ගෙවා ප්‍රාණවත් කිරීම
2. විශේෂ ප්‍රාණවත් කිරීම
   මාස හයකට වැඩි එහෙත් මාස 24 කට නොඅඩු හිඟයක් සඳහා පොළියක් සහිතව හිඟ වාරික මුදල් ඉදිරි වාරිකයන්ට එකතු කොට කොටස් වශයෙන් ගෙවීමට සැලැස්වීමෙන් ප්‍රාණවත් කිරීමයි.

ජීවිත රක්ෂණ ඔප්පුවකට වාරික මුදල් ගෙවීමට නොහැකි වූවකුට ගත හැකි ක්‍රියාමාර්ග

1. පවාරණ අගය ලබා ගැනීම
2. ගෙවා නිමි ඔප්පුවක් බවට පත් කිරීම

<u>සාමාන්‍ය රක්ෂණය</u>

සාමාන්‍ය රක්ෂණයට පහත රක්ෂණයන් අයත් වේ.

1. ගිනි රක්ෂණය
2. සොරබිය රක්ෂණය
3. ස්වභාවික විපත් රක්ෂණය
4. සමුද්‍රීය රක්ෂණය
5. මෝටර් රථවාහන රක්ෂණය
6. වගකීම් රක්ෂණය
7. මාර්ගස්ථ භාණ්ඩ රක්ෂණය
8. මාර්ගස්ථ මුදල් රක්ෂණය

<u>ගිනි රක්ෂණය</u>

කිසියම් ගොඩනැගිල්ලකට හෝ වෙනත් වත්කමකට ගින්නෙන් සිදු විය හැකි හානි ආවරණය කර ගැනීම සඳහා ලබා ගන්නා රක්ෂණ ඔප්පුව

මෙහිදී ගිනි හානි වලට අමතරව අතිරේක වාරික මුදලක් ගෙවීමෙන් පහත අවදානම් ද ආවරණය කර ගත හැකිය.

- කැරලි කෝලාහල / වැඩ වර්ජන හානි
- පිපිරීම් හානි
- විදුලිය මඟින් ඇතිවිය හැකි හානි
- භූමිකම්පා / සුනාමි / අකුණු / ගංවතුර / සුලිසුළං ආදිය මඟින් වන හානි
- ගුවන්යානා වලින් සිදු විය හැකි අනතුරු
- අනුශාංගික අලාභ හානි
- ගැටීම හානි
- පිපිරීම් හානි

ගිනි රක්ෂණයේදී වාරික මුදල තීරණය කිරීමට යොදා ගන්නා පදනම් / කරුණු /සාධක

1. දේපලේ රක්ෂණ අගය
2. දේපලේ පවත්නා ගිනි ඇවිලෙන සුළු භාවය

සාමාන්‍ය වගන්තිය සහිත ගිනි රක්ෂණ ඔප්පුව

- ගිනි උවදුරු සම්බන්ධ ඌන රක්ෂණයක් සිදු කර ඇති විටකදී සිදුවූ අලාභය සමානුපාතිකව ගණනය කර වන්දි ගෙවීම සිදු කරයි.

සාමාන්‍ය වගන්තිය රහිත ගිනි රක්ෂණ ඔප්පුව

- ඌන රක්ෂණයක් කර ඇති විටෙක අදාළ වත්කමට යම් හානියක් සිදු වුවහොත් ඌන රක්ෂණය නොසලකා මුළු හානියේ ප්‍රමාණයම ගෙවනු ලබයි.

අනුශාංගික අලාභ රක්ෂණය

- ගින්න හා වෙනත් උපද්‍රව නිසා දේපල වලට හානි සිදු වීමේදී එම හානියට අමතරව එම උපද්‍රවය හේතු කොටගෙන ව්‍යාපාර කටයුතු අඩපණ වීම නිසා නොලැබී යන ලාභ ආවරණය කර ගැනීම සඳහා ලබා ගත හැකි රක්ෂණාවරණයකි.

මෝටර් රථවාහන රක්ෂණය

රථවාහන අනතුරු වලින් මෝටර් රථවලට, මෝටර් රථ වල ගමන් ගන්නා අයට සහ බාහිර පාර්ශ්වයන්ට සිදු විය හැකි හානි සඳහා වන්දි ලබා ගැනීම ට ලබා ගන්නා රක්ෂණ ක්‍රමයකි.

මේ යටතේ ලබා ගත හැකි ප්‍රධාන ඔප්පු වර්ග 03 කි.

1. පූර්ණ රථවාහන රක්ෂණය
2. තෙවන පාර්ශ්ව ගිනි හා සොරකිය රක්ෂණය
3. අවම තෙවන පාර්ශ්ව රක්ෂණය

පූර්ණ රථවාහන රක්ෂණය මඟින් වාහනයට, එහි ගමන් ගන්නා අයට සහ භාහිර දේපල සහ පුද්ගලයන්ට සිදු වන හානි සඳහා වන්දි ගෙවනු ලැබේ.

තෙවන පාර්ශ්ව ගිනි හා සොරකිය රක්ෂණය යටතේ අදාළ වාහනයට ගින්නෙන් සහ සොරකියෙන් වන හානි සඳහාත් භාහිර පුද්ගලයන්ට හා දේපල වලට වන හානි සඳහාත් වන්දි ගෙවනු ලබයි. නමුත් මෙහිදී වාහන ගැටීම, හැපීම් නිසා සිදුවන අනතුරු වලට වන්දි ගෙවනු නොලැබේ.

අවම තෙවන පාර්ශ්ව රක්ෂණය මඟින් භාහිර පුද්ගලයන්ට හා දේපල වලට සිදුවන හානි පමණක් ආවරණය කරනු ලබයි. මෝටර් රථයක් සඳහා අනිවාර්යෙන්ම ලබා ගත යුතු සහ අවම වියදමකින් ලබා ගත හැකි රක්ෂණාවරණය මෙයයි.

මෝටර් රථ රක්ෂණ වාරිකය තීරණ වීම සඳහා බලපාන සාධක

- මෝටර් රථයේ වටිනාකම
- රක්ෂණයට ඇතුළත් ආවරණ ප්‍රමාණය
- මෝටර් රථයේ වර්ගය සහා වර්ෂය
- මෝටර් රථය යොදා ගනු ලබන කාර්යය

හිමිකම් නොපෑමේ ප්‍රසාද දීමනාව

- රක්ෂණ වාරිකය වාර්ෂිකව අලුත් කරන අවස්ථාවේදී ගත වූ වර්ෂයේ අලාභයන් සඳහා වන්දි ඉල්ලා නොමැති නම් ප්‍රවර්තන වර්ෂයේ වාරිකයෙන් රක්ෂණ සමාගම විසින් අඩු කරනු ලබන මුදල් ප්‍රමාණය යි.

මුක්තාවශේෂය සහා මුක්තාවශේෂ අංගනය

- වාහනයකට පූර්ණ හෝ අර්ථදායි අලාභ ගෙවූ විට එම වාහනයේ සුන්බුන් අගය හඳුන්වන්නේ ‘මුක්තාවශේෂය’ නමිනි. රක්ෂණ ආයතනය විසින් මෙම මුක්තාවශේෂ රක්ෂණ ආයතනට අයත් විශේෂ භූමි භාගයක තබා වෙන්දේසි කරන අතර එය ‘මුක්තාවශේෂ අංගනය’ ලෙස හඳුන්වයි.

සමූහ මෝටර් රථ රක්ෂණය

- එකම පුද්ගලයෙකුට හෝ ආයතනක් සතුව පවතින මෝටර් රථ සමූහයක් ආවරණය කරමින් තනි රක්ෂණ ඔප්පුවක් ලබා ගන්නේ නම් එවැනි රක්ෂණ ඔප්පුවක් මෙලෙස හඳුන්වයි.

රක්ෂණ වාරික මුදල අඩු කර ගැනීම සඳහා රක්ෂිතයෙකුට ගත හැකි ක්‍රියාමාර්ග

1. වන්දි ඉල්ලුම් නොකරන අවම දීමනාවක් නියම කර ගැනීම
2. ලංකා ඔටෝ මොබයිල් සංගමයේ සාමාජිකත්වය ලබා ගැනීම
3. හිමිකම් නොපෑමේ ප්‍රසාද දීමනාවට හිමිකම් ඉදිරිපත් කිරීම

<u>මුහුදු උවදුරු රක්ෂණය</u>

මුහුදු මාර්ග ප්‍රවාහනයේදී නැවට හා නැව් බඩුවලට සිදු විය හැකි හානි මේ යටතේ ආවරණය කරයි.

මෙය මූලික කොටස් දෙකකි.

1. නැව්කඳ රක්ෂණය
2. නැව් බඩු රක්ෂණය

<u>නැව්කඳ රක්ෂණය යටතේ ලබා ගත හැකි රක්ෂණ ඔප්පු</u>

1. සියලු අවදානම් රක්ෂණ ඔප්පුව
   නැවක් මුහුදේ ගමන් කිරීමේදී මෙන්ම තොටුපලක නතර කර තිබීමේදී සිදු වන හානි මෙමඟින් ආවරණය කරයි.

2. පූර්ණ අලාභ පමණක් ගෙවන ඔප්පුව
   මේ යටතේ ගෙවනු ලබන වන්දිය ප්‍රධාන ආකාර දෙකකි.
      i. නිත්‍ය පූර්ණ අලාභ
      ii. අර්ථදායි පූර්ණ අලාභ
   රක්ෂිත නැව මුළුමනින්ම විනාශ වීම නිසා ගෙවනු ලබන වන්දිය නිත්‍ය පූර්ණ අලාභ ලෙසත්, නැව සම්පූර්ණයෙන්ම විනාශ වී නැතත් නැව යථා තත්වයට පත් කිරීමට වන්දි ගෙවීම අර්ථ ශුන්‍ය යැයි සලකා ඔප්පුවේ සඳහන් වටිනාකම ගෙවීම අර්ථදායි පූර්ණ අලාභ ලෙසත් හඳුන්වයි.

3. තොටුපල ඔප්පුව
   නැවක් තොටුපලේ රඳවා තිබෙන විට සිදුවන හානි ආවරණය කරන ඔප්පුවයි.

4. අලුත්වැඩියා ඔප්පුව
   නැවක් අලුත්වැඩියා කිරීමේදී නැවට සිදුවන හානි ආවරණය කරන ඔප්පුවයි.

5. තැනීම් හානි ඔප්පුව
   නැවක් තැනීම ආරම්භ කල දිනයේ සිට එය දියත් කරන දිනය තෙක් සිදු වන සියලු හානි ආවරණය කරයි.

<u>නැව්කඳ රක්ෂණය යටතේ ලබා ගත හැකි රක්ෂණ ඔප්පු</u>

1. විවෘත ඔප්පුව / චල ඔප්පුව
2. අගැයූ ඔප්පුව
3. අනාගත ආවරණ ඔප්පුව

නාවික බිලිකිරිම
නැව සහ නැව් භාරය බේරා ගැනීමේ අරමුණින් නැව් බඩු මුහුදට දැමීම

නාවික අපගමනය
නැව ගමන් කල යුතු නිශ්චිත මාර්ගයෙන් බැහැරව වෙනත් මාර්ගයක ගමන් කිරීමයි.

මුහුදු උවදුරු රක්ෂණයේදී වන්දි නොගෙවන අවස්ථා

1. නාවික වංචනය
2. නාවික අපගමනය

වගකීම් රක්ෂණය

කිසියම් දේපලක් හෝ ව්‍යාපාරයක් නිසා බාහිර පාර්ශ්වයන්ට සිදුවන යම් හානි හෝ පාඩු හානිපූර්ණය කිරීම සඳහා ලබාගන්නා රක්ෂණාවරණය යි.

1. මහජන / පොදු වගකීම් රක්ෂණය
   ව්‍යාපාරවලින් මහජනයාට සිදු විය හැකි හානි ආවරණය කිරීම මෙහිදී සිදු වේ.

2. නිෂ්පාදන වගකීම් රක්ෂණය
   ව්‍යාපාරයක් අලෙවි කරන නිෂ්පාදිත පරිභෝජනය කිරීමෙන් පාරිභෝගිකයන්ට සිදු විය හැකි හානි ආවරණය කිරීම මෙහිදී සිදුවේ.

3. සේවක වගකීම රක්ෂණය
   සේවයේ යෙදී සිටියදී සේවකයන්ට සිදු වන අහඹු සහ වෘත්තීය අනතුරු වෙනුවෙන් වන්දි ගෙවීම මෙහිදී සිදුවේ.

4. දේපල අයිතිකරුවන්ගේ වගකීම් රක්ෂණය
   කුලියට හෝ බද්දට දෙනු ලබන ගොඩනැගිලි වල ඇති විය හැකි දෝෂ නිසා භාහිර පාර්ශ්වයන්ට වන්දි ගෙවීම වෙනුවෙන් මෙම රක්ෂණාවරණය ලබා ගනියි.

මාර්ගස්ථ භාණ්ඩ රක්ෂණය

මාර්ගස්ථ භාණ්ඩ රක්ෂණයේදී එක් ස්ථානයක සිට තවත් ස්ථානයකට ගොඩබිමින් ප්‍රවාහනය කරන භාණ්ඩ සඳහා ඇති විය හැකි හානි ආවරණය කිරීම සඳහා ලබා ගන්නා රක්ෂණ ඔප්පුවයි.

මාර්ගස්ථ මුදල් රක්ෂණය

එක් ස්ථානයක සිට තවත් ස්ථානයකට මුදල් ප්‍රවාහනය කිරීමේදී ඇති විය හැකි හානි ආවරණය කිරීම සඳහා ලබා ගන්නා රක්ෂණ ඔප්පුවයි.

සොරබිය රක්ෂණය

ව්‍යාපාරික ස්ථාන වල හෝ නිවාසවල සිදු විය හැකි සොරබිය අවදානම ආවරණය කර ගැනීම සඳහා සොරබිය රක්ෂණ ඔප්පුවක් ලබා ගත හැකිය.

ස්වාභාවික විපත් රක්ෂණය

විවිධ ස්වාභාවික ආපදා වලින් දේපලවලට සිදුවන හානි ආවරණය සඳහා ස්වාභාවික විපත් රක්ෂණාවරණයක් ලබා ගත හැකිය.

වර්තමානයේ රක්ෂණ සේවාවේ දක්නට ලැබෙන ප්‍රවණතා

- රක්ෂණ සමාගම් පෞද්ගලිකරණය වීම
- නව රක්ෂණ ඔප්පු හඳුන්වා දීම
- වාණිජ බැංකු රක්ෂණ ක්ෂේත්‍රයට එළඹීම
- වන්දි ගෙවීම කාර්යක්ෂම කිරීම
- රක්ෂිතයන්ට වැඩි ප්‍රතිලාභ ලබා දීම